100

**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**

**නීතිවේදී උපාධි පාඨමාලාව – 3 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය – 2008**

**ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීතිය – LWU 1201**

**කාලය – පැය 03 යි**

---

**දිනය : 2008.03.24** **වේලාව: පෙ. ව. 09.30 – ප. ව. 12.30**

---

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ

1 නීතියේ ආධිපත්‍යය යන්න පුළුල් දේශපාලන න්‍යායයක් වන බැවින් ඒ පිළිබඳව සරල සහ පැහැදිලි ප්‍රකාශයක් සකස් කිරීම අපහසු වේ. සමාජයේ දියුණුවත් සමග හා ආණ්ඩුවේ කාර්යයන් වෙනස්වීමත් සමග වෙනස් වන අවශ්‍යතාවන්ට මුහුණ දීම පිණිස නීතිඥයන්, දේශපාලකයන් සහ පරිපාලකයන් පිළිගත් නීතියේ වටිනාකම් පිළිගැනීමට සූදානම් වියයුතුය.

නීතියේ ආධිපත්‍යය පිළිබඳ සංකල්පය ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

2 " අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව පුළුල් විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අඩංගුවන්නේ නම් රටක සියළුම පුද්ගලයන්ගේ සමානාත්ම තාවය ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට හැකි වන්නේය ".

ඔබ ඉහත ප්‍රකාශය සමග එකඟ වන්නේද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

3 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති ජනාධිපති ධූරයේ බලතල සමග 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති ජනාධිපති ධූරයේ බලතල සංසන්දනය හා විභේදනය කරන්න.

4 (අ) 1802 සිට සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැනවීම දක්වා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ඉතිහාසය සංසන්දනය හා විභේදනය කරන්න.

(ආ) ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සුවිශේෂී ලක්ෂණ මොනවාදැයි පැහැදිලි කරන්න.

5 රජයක ප්‍රධාන අංග තුන අතර කාර්යය බෙදීම අනුසාරයෙන් බලතල බෙදීමේ මූලධර්මය පිළිබඳ සංකල්පනාත්මක සෝදාපාළුව පිළිබඳ විස්තර කරන්න .

6 (අ) " පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ආධිපත්‍ය පිළිබඳ මූලධර්මයෙහි ප්‍රමුඛ ලක්ෂණයක් වශයෙන් පැවතීම 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අවසන් විය ."

1972 සහ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් හි ප්‍රතිපාදන ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විභාග කරන්න.

(ආ) " බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණයක් ලෙස ව්‍යවස්ථාදායක ස්වාධිපත්‍ය සංකල්පය ඉස්මතු වීම නිසා රජුගේ බලතල ක්‍රම ක්‍රමයෙන් අඩුවීයාමට මගපෑදිණි."

බ්‍රිතාන්‍යය පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ආධිපත්‍ය කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රස්තුතය විභාග කරන්න .

7 (අ) 1948 සිට 1972 දක්වා කාලය තුල ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයන් සම්බන්ධ විධිවිධාන සමග සසදන විට 1972 සහ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන් විස්තරාත්මක විධිවිධාන ඉදිරිපත් කර ඇත.

ඔබ මෙම ප්‍රකාශය සමග එකග වන්නේද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනමත විචාරය යෙදාගත හැකි අවස්ථාවන් කෙටියෙන් විස්තර කරන්න.

8 පහත ඒවායෙන් ඕනෑම දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) මැකලම් ප්‍රතිසංස්කරණ
(ආ) ඔම්බුඩ්ස්මන් ධුරයෙන් අපේක්ෂා කරන ප්‍රතිකර්ම
(ඇ) සමාජ සුභසාධන නඩුකර
(ඈ) ස්වයංපාලන පිළිබඳ මූලධර්මය

හිමිකම් ඇවිරිණි
************